# මුලතිව්වල අහිංසක මිනිස්සු THE 'INNOCENT PEOPLE' OF MULATHIVU





Today many western countries clamour for the safety of the " Innocent people" trapped in Mulativu caught in the war between the Tigers and SL Armed Forces. We all know that the SriLankan government has taken necessary steps and gone an extra mile to rescue those civilians kept by the Tigers as a human shield. So far thousands of people have crossed to the safety zone designed by the SL govt. from that tiger held, now very small, patch of " Tamil Eelam"

Today, though the Tamil civilians in Mulativu are labelled as " innocent people" by the western media, we cannot forget the fact that three years ago these same "INNOCENTS" willingly got training under Tigers to fight the Sri Lanka government and the Sinhala majority. Even the school children had that training to use weapons. These pictures show it all. Doesn't this give a new meaning to the word - INNOCENCE? Or do we have to stop using it ?



**Top picture** - During school interval, some girls examine an AK47 assault rifle. **Above** - A girl taking target with a hand held mortar gun. There were many reports against teachers of these schools who encouraged LTTE carders' presence at the classes. All these teachers drew salaries from Sri Lanka government.





# ප්‍රංශයේ නව ශ්‍රීලංකා තානාපති දිවුරුම් දුන් දා

අප මව්බිමේ අඩසිය වසරකට ආසන්න කාලයක රාජ්‍ය සේවයේත් පරිපාලන සේව යේද නිරතව සිටි දක්ෂ නිලධාරියෙකු වන ලයනල් ප්‍රනාන්දු මහතා ප්‍රංශයේ නව ශ්‍රීලංකා තානාපතිවරයා ලෙස ප්‍රංශ ජනාධිපති නිකොලා සර්කෝයි මහතා ඉදිරියේ පසුගියදා පැරිසියේ එලිසි මාලිගයේදී ශ්‍රී ලංකා ජනාධිපතිතුමන් හා ජනරජය නියෝජනය කරමින් අක්තපත්‍ර බාරදුන්නේය.

සාමය සහ දේශයේ භෞමික අඛණ්ඩතාව රැකගැනීම සඳහා ශ්‍රීලංකා රජය අඛණ්ඩව ගෙන යනු ලබන මහා ක්‍රියාදාමය තමන් මෙන්ම ප්‍රංශ රජයද බලවත් සේ අගය කරන බවද, ශ්‍රීලංකාවට සංචාරයක් සඳහා පැමිණෙන්නැයි අප තානාපතිතුමන් කළ ආරාධනය බලවත් කෘතඥතාවෙන් යුතුව පිළිගන්නා බවද, ලබන වර්ෂය ඒ සඳහා සුදුසු යයි තමන් සිතන බවද නිකොලා සර්කෝසි මහතා ඒ අවස්ථාවේදී අප තානාපතිතුමන්ට පවසා ඇත.

මේ අතර යුනෙස්කෝවේ ආසියා පැසිපික් කලාපීය නියෝජ්‍ය සභාපතිත්වය ශ්‍රීලංකාවට හිමිවී එය නියෝජනය කිරීමද ලයනල් ප්‍රනාන්දු මහතාට පැවරී ඇත. එහි සභාපති ජපානය වන අතර, ලේකම් තනතුර තායිලන්තයට හිමිව තිබේ.

♦ *අමර ගුණසේකර* **Paris, France**

# A gun from the mobile phone

Don't be surprised if you're asked to whip out your cell phone and make a call next time you go through airport security. A gun that masquerades as a mobile phone may sound like a device concocted for 007, but it's the latest hidden weaponry to show up on the radar of law-enforcement folks.

Some cell-phone guns, seized in drug raids in the Netherlands, England and Germany, have been cited in several federal security alerts last year. .

Though heavier than normal phones, the lethal ones look nearly identical. The hollowed-out devices, made in Croatia, are fired by punching buttons on the keypad and can shoot four .22-cal. bullets in rapid succession.

# මොබයිලය ද දැන් පිස්තෝලයකි



නුදුරු දිනක ගුවන් තොටුපලකට ගිය විට එහි ආරක්ෂා පරීක්ෂණයේදී ඔබේ මොබයිල් පෝනයෙන් කෝල් එකක් ගෙන පෙන්වන්නට යයි කීවොත් ඔබ පුදුම වියයුතු නැත. මක්නිසාද මොබයිල් පෝන් වගේ තැනූ පිස්තෝල ද එයාපෝට් ආරක්ෂකා පරීක්ෂණ යන්ත්‍ර වලට ළඟදී හසුව ඇති බැවිනි. මෙය ජේම්ස් බොන්ඩ් චිත්‍රපටයක දර්ශණයක් ලෙස සිතුනත් වැඩේ හරි ඇත්තය.

ඕලන්දය, ජර්මනිය හා එංගලන්තය ආදී රටවල මත්ද්‍රව්‍ය වැටලීම් වලදී මෙම පිස්තෝල මොබයිල් අසුවී තිබේ. සාමාන්‍ය පෝනයකට වඩා මදක් බර ය. .22 ප්‍රමාණයේ වෙඩි උණ්ඩ 4 ක් දමා පෝනයේ අංක තදකිරීමෙන් වේග යෙන් එක පිට එක පත්තු කළ හැකිය.



# අහිංසකකයින් බේරාගැනීම



දැන් බලාගෙන යනකොට ලෝකෙන් ඉතාම, ඉතාම, ඉතාමත්ම අහිංසක මිනිසුන් ඉන්නේ මුලතිව්වල. ඉතියෝපියාවේ දරුණු සාගතයට අහුවෙලා කුසපොත්තවත් නැතුව අමු ඇටසැකිලි වගේ මැස්සො වහ වහ ඉන්න දරුවන්ටත් වඩා ඉතාම අහිංසක මිනිස්සු මුලතිව්වල කාලයක පටන් කොටුවී ඉන්නා වග ලෝකයම කියනවා. නෝර්වේ වල සොල්හයිම් කියනවා. ඇමරිකාවේ ක්ලින්ටන් ගෑණුකෙනා කියනවා. ලන්ඩනයේ කීත්වාස්, සයිමන් හියුස් පමණක් නෙවෙයි හැරෝවල ඉන්නා කොන්සර්වේටිව් මන්ත්‍රී ගෑනියෙකුත් ගිය සතියෙ කිව්වා. මුලතිව් මෙහේද අහහරු ලෝකෙදැයි නොදන්නා මැක්සිකෝවේ එක්සත් ජාතීන්ගේ නියෝජිතයා පවා කිව්වා. බීබීසී එක හැමදාම කියනවා. තමිල් නාඩුවේ ජයලලිතා, කරුණානිධි සහ වෛයිකෝ නිකම් නෙවෙයි අඩ අඩ කියන්නෙ. ලන්ඩන්වල ඉන්න කොටිත් කියනවා. ටැමිල්නෙට්, නිදර්සනම් දෙමළ වෙබ්අඩවිත් කියනවා. තවත් අය අපෝ ඉන්නවා. ලිස්ට් එක තවත් දිගයි. මෙච්චර දෙනා කියනවා නම් එහෙනම් ඇත්තටම මුලතිව් වල අහිංසක මිනිසුන් ඉන්නවා ඇති කියලා මට හිතෙනවා. ඊළඟ කාරණේ මේකයි. මුලතිව්වල කොටි ත්‍රස්තවාදීනුත් ඉන්න නිසා මෙතන අහිංසක ජනතාවයයි කියන්නේ හරියටම කාටදැයි මට නම් නිච්චියක් නැහැ. සොල්හයිම්, කීත්වාස් බීබීසීකාරයො එහෙම අහිංසක ජනතාවය කියන්නෙ ප්‍රභාකරන් ඇතුළු කොටි ටික ගැන හිතලා. උන්ව බේරගන්නයි දැන් මේ හාදයො ප්ලෑන් කරන්නෙ. බූරුව ගහන කොට, කූට්ටම ඉවරවෙන අන්තිම කොලේ හරි පෙරලිලා දිනුම් කොළේ ඒය කියලා හිතනව වගේ, ප්‍රභාකරන් ඇතුළු මහ කොටියො ටික කොහොම හරි ජීවිතේ බේරගෙන පැනලා ඒවිය කියලයි මුන් හිතාගෙන ඉන්නෙ.

දැන් මේ තීරයෙ උඩම තියන පින්තූරය දිහා බලන්න. ඒ එක්කම වම්පැත්තෙ තියන පොටෝ ටිකත් දිහා හොඳට බලන්න. මේ පොටෝ දැනට අවුරුද්දකට විතර ඉහත ගත්තු ඒවා. මේ තමයි මුලතිව්වල කොටුවෙලා ඉන්න අහිංසක මිනිස්සු එදා හැසිරුණු හැටි. මේ අතේ තියෙන පොලු තමයි තුවක්කු. මේ දකුණේ මිනිස්සුන්ට හා කොළඹ ආණ්ඩුවට පහර දෙන හැටි ව්‍යංගෙන් පෙන්නන්නෙ. කොටි සිංහල ගම්වලට පැනලා දරු පවුල් පිටින් ඝාතනය කරනවා, කොළඹ ඇතුළු නගරවල සිංහළ මිනිස්සු යන බස්වලට බෝම්බ තියනවා. ඒ සියල්ලම අනුමත කරපු මිනිස්සු මේ ගොල්ල. මෙතන පේනවද කොටි බලෙන් පොලු අතට දීලා පුහුණු කරවන බවක්. එහෙම නම් මූණුවල හිනා කොහෙන්ද? දැන් මේගොල්ලද මේ අහිංසකයොයි කියන්නෙ? යුද්ධෙත් නවත්තලා කොහොම හරි මේ ගොල්ලන්ගෙ ඇඟපත වත් හීරෙන්නෙ නැතුව පොඩිදරුවො වඩාගන කරපින්නවා ගන්නවා වගේ බොහොම පරිස්සමින් මේ කස්ටිය මෙහාට උස්සලා ගන්න කියලයි බටහිර රටවල් මේ ලංකාවට කෑගහන්නෙ.

පහුගිය අවුරුදු විසිපහ ඇතුළත මේ අහිංසකයොයි කියන ජනතාවම තමයි තමන්ගෙ රටේම ඉන්න සහෝදර වැසියන් විනාසකරන්න ත්‍රස්තවාදීන්ට කැමැත්තෙන්ම උදව්දුන්නෙ. කොටි ඔච්චර දේවල් උතුරෙ සම්පාදනය කරගෙන යුද්ධෙකට ලෑස්ති වෙද්දි ඒ වගක්වත් කටේ කෙළ බිම හලන්නෙ නැතුව සද්ද නැතුව රැකගෙන ඊළම් රාජ්‍යයක ඉන්න හීන මවපු කට්ටිය මේගොල්ල. තඹ සතේක බද්දක් ගෙව්වෙ නැහැ. උතුරෙ සේරම දේවල් ආණ්ඩුව ගණනෙ නිකම් හම්බ වෙද්දිත් කවදාවත් හොඳක් නොකිය ආණ්ඩුවෙත්, සිංහලයගෙත් නුගුණම කියපු කට්ටිය මේ. එහේ ඉස්කෝල ළමයි පවා තුවක්කු පන්ති කාමර වලට ගෙනැල්ලා පුරුදුවුණා සිංහලයට වෙඩිතියන්න.

බෝම්බ පුපුරවලා මිනිස්සු සිය ගණන් මරාගෙන මැරිච්ච කොටියන්ගෙ ගෙවල්වල අම්මලා තාත්තලා, පුතාගෙ හරි දුවගෙ හරි පොටෝ එකක් ගහගෙන බටහිර මාධ්‍යයට අඬ අඬ කිව්වා මගේ දරුවා උතුම් දෙයක් වෙනුවෙනුයි මැරුණේ කියලා. මොකක්ද මේ උතුම් දේ? ලංකාව විනාස කරපු එක. දැන් කියනවා මේ ගොල්ල අහිංසකයොලු. කාටද මේ සුදුළුණු පොඩිකරන්නෙ? අපට දැන් අහිංසක කියන වචනෙ තේරුම වෙනස්කරන්න වෙනවා. අහිංසකම කියන්නෙ මේක නම් අපිට අහිංසකයො නූනට කමක් නෑ. අහිංසකකම උත්පත්තියෙන්ම මනුස්සයට එන දෙයක්. වැඩේ වැරදුනාම අහිංසක පාට් එක පෙන්නනවනම් ඒ රඟපෑම. ඒක අපි තේරුම් අරන් තියෙන්නෙ.

♦ **වෙලේගෙදර රාළ London**